**උකුවෙල ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

**------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 07 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 02 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව සතු ඉඩම් 02ක, සුසාන භූමි 10ක හා පොදු ළිං 61ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණු අතර, සභා කාර්යාල ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම රු.135,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). සභාව වෙත ලැබී තිබුණු ෆෝටන් වර්ගයේ ටිපර් රථයේ හා ට්‍රැක්ටරයේ වටිනාකම මෙන්ම රු.25,668ක් වටිනා කසළ බඳුන් 93ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ). සභාවේ ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.4,641,745ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ). මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශයෙන් ඉ - නැණ පියස ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණු රු.594,061ක පරිගණක හා උපාංග විෂයයන් 21ක සහ පිළිසරු ව්‍යාපෘතිය මගින් ලබා දී තිබුණු රු.200,000ක් වූ සීවර් යන්ත්‍රයේ වටිනාකම සහ සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝටලයකින් අයවිය යුතු රු.169,627ක ආදායම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඉ). දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.5,186,983ක් අඩුවෙන් හා තාර බැරල් 11ක සහ 3/4" කොන්ක්‍රිට් ගල් 1/4" චිප්ස් තොගයේ වටිනාකම රු.239,600ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි

(ඊ). ලැබිය යුතු රු.979,763ක කර්මාන්ත ණයගැති ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණු අතර, රු.776,100ක කර්මාන්ත ණයහිමි ශේෂයක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ගැල්වනයිස් බට 560න් සභාව සතුව පවතින බට 286හි රු.316,602ක් වූ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්
-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.105,208,260ක් වූ ගිණුම් විෂයයන් 06කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.12,331,729ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 07ක එකතුව රු.33,015,967ක් වූ අතර, වර්ෂ 05කට වැඩි කාලයක් ඉක්මවූ රු.31,137ක ශේෂයක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්
----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණයහිමි ශේෂ වටිනාකම රු.37,807,163ක් වූ අතර, වර්ෂ 05කට වැඩි කාලයක් ඉක්මවූ රු.94,775ක ශේෂයක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.89,532,551ක් වූ ගිණුම් විෂයයන් 08කට අදාළ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති ,රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | **නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ). | නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ 6/6 (i) වගන්ති | අනවසර ඉදිකිරීම් 14ක් වාර්තා වී තිබුණද, සභාව විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ආ). | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවී දීමනා ගෙවමින් සිටි කම්කරුවන් තිදෙනෙකුට ස්ථිර තනතුරු ප්‍රදානය කර තිබුණි. |

1.3.7 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව රාමසාන් උත්සවය සහ 5 වසර ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන් පවත්වන ලද සම්මන්ත්‍රණ සඳහා රු.85,897ක මුදලක් වැය කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,192,387ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,436,943ක් විය. ඉකුත් වර්ෂය සමඟ

සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,244,556ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 02 තුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ). මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට එම ප්‍රතිශතයේ අඛණ්ඩ පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

(ආ). මුළු ආදායම සහ වියදම අතර අනුපාතයේ අඛණ්ඩ ඉහළ යාමක් පෙන්නුම් කෙරෙන අතර, එය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණය විය.

(ඇ). සමුච්චිත අරමුදලේ ශේෂය සෘණ අගයක් ගෙන තිබුණු අතර, එය අඛණ්ඩව වැඩිවන අගයකින් වර්ධනය වෙමින් පැවතුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම සෘණ අගය රු.18,489,425කින් වැඩි වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

--------------------------------------------

සභාව සතු ජල බවුසරය හා මාර්ග තලන යන්ත්‍රය මඟින් සමාලෝචිත වර්ෂය තුළ උපයාගෙන තිබුණේ රු. 37,350 ක ආදායමක් පමණි. ආදායම් වර්ධනය කර ගැනීම සඳහා මෙම සම්පත් උපරිම අයුරින් යොදවා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

2.3.2 වරිපනම් බදු

----------------

හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.780,255ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂයකට වඩා වැඩි කාලයක් හිඟහිට ඇති රු.441,443ක ශේෂ ඇතුළත්වී තිබුණි.

2.3.3 අක්කර බදු

--------------

හිඟහිටි අක්කර බදු ශේෂය රු.31,137ක් වූ අතර, එම ශේෂය වසර 05ක කාලයක සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

2.3.4 ජල ගාස්තු

--------------

හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.1,486,941ක් වූ අතර, එම ශේෂය තුළ වසරක කාලයක් ඉක්මවූ රු.1,310,487ක ශේෂ ඇතුළත්වී තිබුණි.

2.3.5 දැන්වීම් පුවරු ගාස්තු

------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය vii (ඊ) හා xxx උපවගන්ති වල විධිවිධාන අනුව පෞද්ගලික ව්‍යාපාර ආයතන 02ක් විසින් ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරුවලින් රු.68,750ක මුදලක් අයකරගෙන නොතිබුණි.

2.3.6 ඉඩම් විකුණුම් ගාස්තු

-------------------------

ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණන ලද ඉඩමක විකුණුම් වටිනාකමෙන් සියයට 1ක බද්දක් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 154 (i) වගන්තියේ විධිවිධාන අනුව ප්‍රාදේශීය සභාවට අයකරගත යුතු වුවද,ඉඩම් වෙන්දේසි 03කින් තාවකාලික තක්සේරු වටිනාකමක් මත බදු මුදල් අයකරගෙන තිබුණි.

2.3.7 පරිසර බලපත්‍ර ගාස්තු

-------------------------

2000 අංක 53 සහ 1988 අංක 56 දරන ජාතික පරිසර පනත හා අංක 1533/6 හා 2008 ජනවාරි 25 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව කල්ඉකුත් වී ඇති පරිසර බලපත්‍ර සඳහා නැවත බලපත්‍ර ලබා නොගැනීම නිසා, රු.35,200ක ආදායම් සභාවට අහිමි වී තිබුණි.

2.3.8 බදු කුලී

----------

(අ) (i). 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවී නව වෙළඳපළ අංක 01 කුකුල් මස් කඩය රු.750ක මාසික කුලියක් මත 2013 සිට වර්ෂ 5ක කාලයක් සඳහා දීර්ඝකාලීනව බදු දී තිබුණි.

(ii). වසර 05කට වරක් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කල යුතු වුවද, සභාව සතු පැරණි වෙළඳපළ කඩකාමර 11ක බදුකුලී සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) හිඟහිටි බදු කුලී ශේෂය රු.106,276ක් වූ අතර, එම ශේෂය වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පැවතුණි.

(ඇ) තක්සේරු දෙපාර්තමේන්තුව මගින් 2010 වර්ෂයේදී නව වෙළඳපළ "ඒ" කොටසේ කඩකාමර කුලිය තක්සේරු කරවාගෙන තිබුණද, එම තක්සේරු මත මුදල් අයකර නොගැනීම නිසා සභාවට රු.304,800ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී ටෙන්ඩර් මගින් ලබාදී තිබුණු පොදු වෙළඳපල අංක 16 දරන මස් කඩය සභා තීරණයක් මත දීර්ඝකාලීනව බදු දීම නිසා සභාවට ලැබිය යුතුව තිබුණු රු.432,000ක් වූ වාර්ෂික ආදායම රු.18,000 දක්වා අඩුවී තිබුණි.

2.3.9 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,476,558ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.7,855,865ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්ය සාධනය ඇගයීම

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ඉන්ධන පිරවුම්හලක් ඉදි කිරීම, මාර්ග නඩත්තු ඒකකයක් පිහිටුවීම හා නගරයේ රථ වාහන පරිපාලනය වැනි යෝජනා ක්‍රම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම ප්‍රධාන අරමුණ වී තිබුණද, එකී ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

(ආ). ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් ඉහළ නැංවීම, මංමාවත් නඩත්තුව, කාණු පද්ධති පිරිසිදු කිරීම අපේක්ෂිත අයුරින් සිදු වී නොතිබුණු අතර, ආදාහනාගාරයක් ඉදිකිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02ක තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 1008කින් අයදුම්පත් 623ක් අනුමත කර තිබුණු නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 57ක් සඳහා පමණි.

(ආ). පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ "ඉ" - නැණ පියස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.594,061ක් වටිනා විෂයයන් 10කට අයත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඒකක 21ක් සභාව වෙත ලබා දී තිබුණු නමුත්, එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ඇ). 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව, රු.60,748ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් ඉටුකර තිබුණු කර්මාන්ත 14කට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මුදල් ප්‍රතිපූරණය වීමට පෙර සභා අනුමැතියක් නොගෙන, සභා අරමුදලින් රු.438,007 ක මුදල් ගෙවා තිබුණි.

(ආ). මුදල් කමිටුවේ සහ සභාවේ අනුමැතියක් ලබා ගෙන කර්මාන්ත 04ක් සඳහා රු.749,308ක මුදලක් ගෙවා තිබුණු නමුත්, එම මුදල් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

3.4 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

ඇල්කඩුව නගරයේ ඇති පැරණි පුස්තකාලය හා ආයුර්වේද බෙහෙත් ශාලාව පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට යොදවා නොගැනීම නිසා, ගරා වැටෙමින් පැවතුණු අතර, නව වෙළඳපල සංකීර්ණයේ කඩකාමර 02ක් බදු දීමට කටයුතු නොකර වසා දමා තිබුණි.

3.5 හඳුනාගත් අලාභ

--------------------

පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය මඟින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස ලබා දී තිබූ ගැල්වනයිස් බටවලින් රු.250,210ක් වටිනා බට ඒකක 226ක ඌනතාවයක් විය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ).

| ප්‍රතිපාදන | කර්මාන්තයේ නම | වැයකර තිබුණු මුදල | භෞතිකව පරීක්ෂා කල දිනය | අඩුපාඩුව |
|---|---|---|---|---|
| | | රු. | | |
| ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන | පතිංගොල්ල මාර්ගය සංවර්ධනය කිරීම (සෘජු ශ්‍රම පදනම මත) | 3,064,869 | 2015 ජූලි 20 | වැඩ විෂයය අංක 09 යටතේ දෙවනවර වර්ග මීටර් 2,250ක තාර ආලේපනය කිරීම සඳහා රු.321,750ක් ඇස්තමේන්තු කර තිබුණු ද, පරීක්ෂණ දිනය වන විටත් තාර ආලේපනය සිදුකර නොතිබුණි. |

(ආ). සභාවේ සෘජු ශ්‍රමය මත ගොඩනැගිලි ඉදි කිරීම හා මාර්ග සංවර්ධනය සඳහා රු.3,535,422ක ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා දී තිබුණු නමුත්,එම ද්‍රව්‍ය යොදා අදාල කර්මාන්ත නිමකල බවට මැනුම්පත් හෝ කර්මාන්ත සාර්ථකව නිමකල බව තහවුරු කෙරෙන තාක්ෂණ නිලධාරී වාර්තා හෝ ලබාගෙන නොතිබුණි.

(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 114 රීතිය අනුව ඉදිකිරීම් ආරම්භ නොකල ව්‍යාපෘති 05 ක් සඳහා කිසිදු අධීක්ෂණයකින් තොරව රු.271,200ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණද,ඒවා නිරවුල් කරගෙන නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේදී "ජාතික සවිය ගම නැඟුම" ව්‍යාපෘතිය යටතේ ඉදිකල කැන්දගොල්ල 2 කණුව අසළින් යන මාර්ගය සංවර්ධනය කිරීමෙන් පසු දිස්ත්‍රික් ඉංජිනේරු විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර තිබුණු. මෙම මාර්ගයේ ඝනකම දුර්වල බැවින් 1:2:4 (3/4) මිශ්‍රණයෙන්

2" ඝනකමට කොන්ක්‍රීට් තට්ටුවක් යෙදීම සුදුසු බව නිර්දේශ කර තිබියදීත් එම කාර්යය ඉටුකරවා නොගෙන සහා අරමුදලින් රු.659,211ක මුදලක් ගෙවා තිබුණු නමුත්, ඉන් රු.463,888ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන ටොන් 03ක පමණ ඝන අපද්‍රව්‍යවලින් විශාල ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණයට යොමු නොකර පරිසරයට හානි වන අයුරින් බැහැර කරන බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත්කර තිබුණද එම නිලධාරියාට වෙනත් රාජකාරීන්ද පවරා තිබීම හේතුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

2014 අගෝස්තු 08 දිනැති අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

4.3 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ආදායම් විෂයයන් 05ක රු.885,000ක් වූ ඇස්තමේන්තුගත ආදායම්වලින් කිසිදු ආදායමක් උපයා ගෙන නොතිබුණු අතර, තවත් ආදායම් විෂයයන් 09ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 03 සිට සියයට 58 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ආ). වැය විෂයයන් 20ක් සඳහා වූ රු.2,968,250ක සම්පූර්ණ ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර, තවත් වැය විෂයයන් 22ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 0.6 සිට සියයට 65 දක්වා වූ පරාසයක විචලනයන් පැවතුණි.

4.4 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්
---------------------------------------------------------------

සභාව වෙත ඉදිරිපත් කර තිබුණු විගණන විමසුම්වලින් විමසුම් 05කට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනු වල වටිනාකම රු.15,575,105ක් විය.

5. පද්ධති හා පාලන
---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අයවැය පාලනය
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). ණයගැති පාලනය
(ඊ). ගබඩා පාලනය
(උ) කොන්ත්‍රාත් පාලනය